

# රහස්බව තුළ මුවාවී

## පශ්චාත් යුධ දිස්ත්‍රික්ක තුළ මුස්ලිම් කාන්තාවන් ලිංගික අල්ලසට ලක්වීම

- සංක්ෂිප්ත පත්‍රිකාව -

Centre for Equality and Justice

# පෙරවදන

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණය ආරම්භ කරන ලද්දේ ෆෝකුස් විමෙන් ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මකව සිටි අතරතුර ය. අධ්‍යයනය අවසන් කර මුද්‍රණය කිරීම 2018 ජූලි මස සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය මගින් සිදු කරන ලදී.

ෆෝකුස් විමෙන් (දැන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය) විසින් 2015 වසරේදී පර්යේෂණ අධ්‍යයන මාලාවක් සිදුකරන ලදී. මේවායින් පශ්චාත් යුද සන්දර්භය තුළ කාන්තාවන් මුහුණ දුන් අභියෝග රැසක් විදහා දැක්වීය. රාජ්‍ය නිලධාරීන් සහ ආරක්ෂක හමුදාවල සාමාජිකයින් ඇතුළු අන් අය අතින් කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක්වීම යුද්ධයෙන් පසු මතු වූ සංසිද්ධියකි. කාන්තා ගෘහ මූලිකයෝ විශේෂයෙන් අවදානමට ලක් වන අය වෙති. පිරිමියෙකු නොමැති විට, සිය අධිකාරී බලය අනිසි ලෙස භාවිතා කර මෙම කාන්තාවන් ලිංගික සූරා කෑමට ලක් කරන ප්‍රතිපත්ති රහිත නිලධාරීහු මෙම කාන්තාවන් ඉලක්ක කර ගනිති.

ෆෝකුස් විමෙන් (දැන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය) විසින් උතුරෙහි කාන්තා ගෘහ මූලිකයින් ලිංගික සූරාකෑමට ලක්වීම ගැන 2016 වසරේ අධ්‍යයනයක් සිදුකර එවැනි සිද්ධි අධ්‍යයන 25 ක් ලේඛන ගත කරන ලදී. මෙම පර්යේෂණය තුළින් ගැටළුවෙහි පැතිර පවතින ස්වභාවය සහ තවදුරටත් ලිංගික අල්ලස් සිදුවීම් ගැන විමසීම් කිරීමෙහි අවශ්‍යතාවය හෙළිදරව් කෙරිණි. මුස්ලිම් කාන්තාවන් අතර ලිංගික සූරාකෑමෙහි ව්‍යාප්තිය සහ ස්වභාවය අවබෝධ කර ගැනීම පිණිස, විවිධ බල අධිකාරී මට්ටම්වල සිටින රාජ්‍ය සේවයේ නිලධාරීන් අතින් ලිංගික අල්ලසට මුහුණ දී ඇති කාන්තාවන් පිළිබඳ ගැඹුරු සිද්ධි අධ්‍යයන 10 ක් මෙම අධ්‍යයනය මගින් ලේඛනගත කරන ලදී. කාන්තාවන්ගේ සැමියන් නොමැති විට, තම බල අධිකාරියෙන් අනිසි ප්‍රයෝජන ගන්නා බලයේ සිටින පිරිමි මෙම කාන්තාවන් ඉලක්ක කර ගෙන ලිංගික සූරා කෑමට ලක් කරති. මෙම අධ්‍යයනය මෙම සිද්ධීන්ගේ කථාවස්තූන් පිළිබඳ විශ්ලේෂණයක් සපයන අතර, ගැටළුව පිළිබඳව කටයුතු කළ යුත්තේ කෙසේද යන්න ගැන අදාළ පාර්ශවකරුවන් හට නිර්දේශ ද සපයයි.

මෙම අධ්‍යයනය සිදුකිරීම සහ දක්වන ලද කැපවීම සහ උද්‍යෝගය වෙනුවෙන් ක්‍රියාකාරිනී ශ්‍රීන් සරූර් හට අපි ස්තූතිවන්ත වෙමු. මෙම සිද්ධි අධ්‍යයන තුළ ලේඛනගත කර ඇති, ලිංගික සූරාකෑමට ලක්වූ මෙම කාන්තාවන්ගේ අත්දැකීම් රජය විසින් රාජ්‍ය නිලධාරීන් සඳහා ආචාරධර්ම පද්ධති සැකසීමේදී ද, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව සහ අල්ලස් කොමිෂන් සභාව වැනි නියෝජිතායතන මගින් මෙවැනි සිද්ධීන් පිළිබඳව ක්‍රමානුකූලව කටයුතු කිරීම සඳහා මග පෑදීමට ද සැළකිල්ලට ගත යුතුය. මෙම අධ්‍යයනය ලිංගික අල්ලස පිළිබඳ නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයට ද දායක වනු ඇතැයි සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය බලාපොරොත්තු වේ. මෙම වාර්තාව සිය කතාන්දර පැවසූ කාන්තාවන් හට පිදෙන උපහාරයකි.

**ශ්‍යාමලා ගෝමස්**
***විධායක අධ්‍යක්ෂක,***
***සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය***

© සමානාත්මතාවය සහ යුක්තිය සදහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice).
සියළු හිමිකම් ඇවිරිණි.

නිර්මාණය: ජෙමී ඇල්ෆොන්සස්
රූප මූලාශ්‍රය: google.com

2018 ජූලි මස මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදී.
විවෘත සමාජ පදනම් (the Open Society Foundations) මගින් අරමුදල් සපයන ලදී.

මෙම ග්‍රන්ථයෙහි ප්‍රකාශකර ඇති අදහස් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූවන්ගේ අදහස් වන අතර, ඒවා අවශ්‍ය වශයෙන් සමානාත්මතාවය සහ යුක්තිය සදහා වූ කේන්ද්‍රය, (ශ්‍රී ලංකා) හි අදහස් සහ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි. මෙම ප්‍රකාශනයෙහි කිසිදු කොටසක් පූර්ණ පිළිගැනීමකින් තොරව ප්‍රතිනිෂ්පාදනය කිරීම, සමුද්ධරණ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් හෝ ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායාපිටපත් කිරීම, පටිගත කිරීම හෝ අන් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම නොකළ යුතුය.

*වැඩිදුර තොරතුරු සඳහා අමතන්න:*
සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice)
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05.
දුරකථන/ෆැක්ස්: +94 11 2055404

# අන්තර්ගතය


| | |
|---|---|
| හැඳින්වීම | 1 |
| ලිංගික අල්ලසෙහි නෛතික සහ ව්‍යවස්ථාමය ගම්‍යාර්ථයන් | 2 |
| ක්‍රමවේදය | 2 |
| සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන් සන්දර්භගත කිරීම | 4 |
| සොයාගැනීම් පිළිබඳ විශ්ලේෂණය | 4 |
| අපරාධකරුවෝ/චූදිතයෝ | 5 |
| ලිංගික සූරාකෑමට සහ ලිංගික අල්ලසට මග පෑදූ වාතාවරණයන් | 6 |
| ලිංගික සූරාකෑමේ සහ ලිංගික අල්ලසෙහි ස්වභාවයන් | 6 |
| නිර්දේශ | 13 |


** මෙම අධ්‍යනය සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රජාවන්හි යුද්ධයෙන් විපතට පත් කාන්තාවන්ගෙන් ලිංගික අල්ලස් ලබාගැනීම පිළිබඳ පර්යේෂණ මාලාවේ තෙවැන්නයි.

.

,



# හැඳින්වීම

මෙම අධ්‍යයනය මූලිකවම නැගෙනහිර පළාත (ත්‍රිකුණාමලය, මඩකළපුව සහ අම්පාර) මෙන්ම පුත්තලම (වයඹ පළාත) සහ පොළොන්නරුව (උතුරුමැද පළාත) යන දිස්ත්‍රික්කවල ජීවත්වන මුස්ලිම් කාන්තාවන් ලිංගික සූරාකෑමට සහ ලිංගික අල්ලසට ලක්වීම කෙරෙහි අවධානය යොමු කරයි. එය යුද්ධයෙන් බලපෑමට ලක්වූ උතුරෙහි ද්‍රවිඩ කාන්තාවන් (ෆෝකුස් විමෙන් 2016) සහ දකුණෙහි සිංහල යුද වැන්දඹුවන් (ෆෝකුස් විමෙන් 2017) පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ මත ගොඩනඟා ඇත.

නැගෙනහිර සහ උතුරෙහි බොහෝ මුස්ලිම් ප්‍රජාවන් සමූහ ඝාතන සහ පිටමං කිරීම්, දිගුකාලීන අවතැන්වීම්, 'අතුරුදහන් වීම්', පැහැර ගැනීම් සහ ජීවනෝපායය සහ ඉඩම් අහිමිවීම්වලින් පීඩාවට පත් වූ බව සිතෙහි තබාගැනීම වැදගත්ය. මෙම අධ්‍යයනයෙහි කොටසක් වූ සමහර මුස්ලිම් කාන්තාවන් යුද්ධය හේතුවෙන් අවතැන් වී ඇති අතර, එක් කාන්තාවක් හට යුද්ධය අතරතුර සිය පළමුවන සැමියා අහිමි විය.

මෙම අධ්‍යයනය ගෘහ මූලික කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොකළත්, සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූ කාන්තාවන් දස දෙනාගෙන් සත් දෙනෙක් තනිකඩයින් වූ අතර ප්‍රධාන ආදායම් සපයන්නා ලෙස පවුලෙහි මූලික තැන ගත්හ. කෙසේවෙතත්, ඔවුන් තමන්ව, "ගෘහ මූලික" ලෙස හැඳින්වීම ප්‍රතික්ෂේප කරන ලද්දේ, සමහර විට සංස්කෘතිකමය සම්මතයන් නිසා විය හැක; ඔවුහු වඩාත් වැඩිහිටි ඥාතියෙකු - මව, නැන්දම්මා හෝ පිරිමි ඥාතියා - ගෘහ මූලිකයා ලෙස හඳුන්වාදීමට වැඩි කැමැත්තක් දැක්වූහ.

දශක ගණනාවක් තුළ කරන ලද පුළුල් පර්යේෂණවලින් පැහැදිලිව පෙන්වා දී ඇත්තේ, කාන්තා ගෘහ මූලිකයින් නිවසෙහි පිරිමියෙකු නොමැති වීමේ හේතුවෙන්, ලිංගික හිංසනය, ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස පිළිබඳව විශේෂයෙන් අවදානමට ලක්වන බවයි. ඔවුන්ගේ ආර්ථික පැවැත්ම සහ සමාජ-දේශපාලනික තත්ත්වය බොහෝ විට රඳා පවතින්නේ, ඔවුන්ට සහාය සහ සේවාවන් අත්‍යවශ්‍ය වන රාජ්‍ය නියෝජිතයින්ගේ සහයෝගීත්වය මතය. මෙය ඔවුන්ගේ අවදානම තවත් උග්‍ර කරයි.

ලිංගික සූරාකෑම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අර්ථ දැක්වීම වනුයේ "වෙනත් කෙනෙකු ලිංගික සූරාකෑමට ලක්කිරීමෙන් මූල්‍යමයව, සමාජයීයව හෝ දේශපාලනිකව වාසි ලබාගැනීම ඇතුළුව, නමුත් ඒවාට සීමා නොවූ, අවදානමට ලක්වීමට ඇති හැකියාව, වෙනස් අන්දමේ බලපෑම්, හෝ විශ්වාසය, වැනි තත්ත්වයන් ලිංගික පරමාර්ථයන් සඳහා සැබෑ ලෙස අපයෝජනය කිරීම හෝ එසේ කිරීමට තැත්කිරීම ය". ලිංගික අල්ලස යනු, ත්‍යාග සහ වාසි හෝ යම් ආකාරයක සේවා ලබාදීම වෙනුවෙන් හුවමාරුවට ලිංගික හැසිරීම් ලබාගැනීමට පෙළඹවීම් කරන ලිංගික සූරාකෑමේ සුවිශේෂී ආකාරයකි.

උතුරෙහි ඔවුන්ගේ ද්‍රවිඩ සගයින් සහ දකුණෙහි සිංහල සගයින්ට සමානව, නැගෙනහිර මුස්ලිම් කාන්තාවෝද නිරන්තරව ලිංගික හිංසනයට මුහුණදීම මෙන්ම ලිංගික අල්ලස සහ අනෙකුත් ආකාරවල ලිංගික සූරාකෑම්වලට බලහත්කාරයෙන් පෙළඹවීම පිළිබඳව පැමිණිලි කළහ. එසේ සිදුවූයේ ඔවුන් රජයේ රැකියා සඳහා ඉල්ලුම් කිරීමේදී, පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරීමට හෝ වාර්තා ලබා ගැනීමට උත්සාහ කළ විට, මූල්‍යාධාරයක් සඳහා ඉල්ලුම් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගිය විට, ලියකියවිලි සහතික කර ගැනීමට ග්‍රාම නිලධාරී වෙත පිවිසුණු විට, පරිවාස නිලධාරියෙකු සමග සම්බන්ධ වීමේ දී සහ ප්‍රාදේශීය පාසලක උසස් ශ්‍රේණියකට දැමීමට පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ආයාචනා කළ විට, යන අවස්ථාවලදීය.

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් කාන්තා සංවර්ධන නිලධාරීන් වැනි රාජ්‍ය නිලධාරීන් මෙන්ම මුස්ලිම් ප්‍රජා සේවකයින් සහ ක්‍රියාකාරීන් විසින් දරා සිටි පොදු උපකල්පන එනම්, සිංහල සහ ද්‍රවිඩ කාන්තාවන් මෙන් නොව, මුස්ලිම් කාන්තාවන් හට ලිංගික අල්ලසට අඩු අවදානමක් ඇති බවත්, එසේ වන්නේ ඔවුන් ඇඳුමෙන් සහ හැසිරීමෙන් වඩාත් විනීත වන නිසා බවත්, පවතින සේවාවන් ගැන දැනුවත් බවක් නොමැති නිසා ඔවුන් රජයේ සහාය ලබාගැනීමට පිටතට යන්නේ බොහෝ කලාතුරකින් නිසා බවත්, පවුල්වල පවතින පුරුෂාධිපත්‍යය යන උපකල්පන මෙම අධ්‍යයනය මගින් ව්‍යාජ බවට පත් කරන ලදී.

**මෙම සංක්ෂිප්ත පත්‍රිකාව ශ්‍රී ලංකාව තුළ ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා පවතින නෛතික සහ ව්‍යවස්ථාමය රාමුව පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි, පර්යේෂණ අධ්‍යයනය සඳහා භාවිතා කළ ක්‍රමවේදය විදහා දක්වයි, සිද්ධි අධ්‍යයන දහය තුළ විස්තර කර ඇති කාන්තාවන් සන්දර්භගත කරයි. සිද්ධි අධ්‍යයන තුළින් ලබාගත් ප්‍රධාන කරුණු සාරාංශ කර දක්වා විවිධ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් එය අවසන් වෙයි.**

# ලිංගික අල්ලසෙහි නෛතික සහ ව්‍යවස්ථාමය ගම්‍යාර්ථයන්

- රාජ්‍ය නිලධාරීන් විසින් අල්ලස් ගැනීම අල්ලස් පනත උල්ලංඝණය කිරීමකි. පෞද්ගලික සමාගම්, ආයතන සහ තනි පුද්ගලයින් මෙම නීතිය මගින් ආවරණය නොකරන අතර, මෙම නීතියෙන් දඬුවම් කළ නොහැක. පෞද්ගලික අංශය තුළ ලිංගික හිංසනය සඳහා දඬුවම් වෙනත් නෛතික රාමු මගින් සපයයි.

- අල්ලස් පනතෙහි ලිංගික අල්ලස විශේෂයෙන් සඳහන් කර නොමැති අතර, "පාරිතෝෂයෙහි" අර්ථ දැක්වීම තුළ "කිනම් ආකාරයක හෝ විස්තරයකින් පහදා දෙන ඕනෑම අනුග්‍රහයක් හෝ වාසියක් ඇතුළුව" යන්න, ලිංගික වාසි ද ආවරණය කරන ලෙස අර්ථ නිරූපණය කළ හැකිය.

- ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය අවධාරණය කරනුයේ, "පාරිතෝෂය" යන වචනය මුදලට සම්බන්ධ පාරිතෝෂවලට හෝ මුදල්වලින් තක්සේරු කළ හැකි පාරිතෝෂවලට සීමා වී නොමැති බවයි. එම නිසා එය ලිංගික පාරිතෝෂ ද ඇතුළත් කරන ලෙසට අර්ථ නිරූපණය කළ හැක.

- ලිංගිකරණය වූ අල්ලසෙහි ස්වභාවයන් ලිංගිකත්වය මත පදනම් වූ වෙනස්කොට සැළකීමක් ලෙස ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ ආවරණය කර ඇත්තේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් ලෙසය. එබඳු ක්‍රියාවක් සිදු කරන පාර්ශවය රජයේ විධායක හෝ පරිපාලන අංශයන්ට අයත් වූවකු වීම කොන්දේසියකි.

> 'ඔහු මා ළඟට විත්, ඔහුගේ ඇඟ මගේ ඇඟේ අතුල්ලා, මට උදව් කරන්නට කැමති බව පැවසුවා.'

# ක්‍රමවේදය

- මෙම පර්යේෂණය සිදුකරන ලද්දේ මුස්ලිම් කාන්තාවන්, විශේෂයෙන් ක්‍රියාකාරිනියන් හට ඉතාමත් අනාරක්ෂිත කාල පරිච්ඡේදයක් තුළය. මෙම කාලයේදී ඔවුන් විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි ප්‍රතිසංස්කරණ ගැන උද්දේශනය කිරීම නැවැත්වීමට මුස්ලිම් ආගමික නායකයෝ ඔවුන්ව සමීපව අධීක්ෂණය කරමින් සිටියහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලිංගික අල්ලස අත්දකින ලද බොහෝ කාන්තාවෝ පර්යේෂිකාවන් වෙත යාමට බිය වූහ.

- එබැවින්, මෙම පර්යේෂණ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පළාත් තුනක - නැගෙනහිර, වයඹ සහ උතුරුමැද මුස්ලිම් කාන්තාවන් දස දෙනෙකුට සීමා කිරීමට සිදුවිය. මෙය ලිංගික අල්ලස අත්දැක තිබිය හැකි මුස්ලිම් කාන්තාවන්ගෙන් ඉතා කුඩා කොටසකි.

- මුස්ලිම් කාන්තාවන් දෙදෙනෙක් පොලීසියට එරෙහිව ලිංගික අල්ලස් සඳහා පැමිණිලි කර තිබුණත්, මින් එක් අයකු අධිකරණය වෙතද ගොස් තිබූ අතර, අපට ඔවුන්ව සොයා ගැනීමට අපහසු වූ බැවින්, සම්මුඛ සාකච්ඡාවලට සහභාගී කර ගැනීමට නොහැකි විය. එක් කාන්තාවක් ඇය විසින් චෝදනා කළ පුද්ගලයින්ගේ බිය වැද්දීම් සහ අසල්වැසියන්ගේ අවලාදවලින් වැළකීමට දිස්ත්‍රික්කයෙන් පිටව ගොස් තිබුණි.

- සම්මුඛ සාකච්ඡාවලට භාජනය කළ කාන්තාවන් දස දෙනාගෙන් අට දෙනෙක්, තිස් වසරක සිවිල් යුද්ධයෙන් ප්‍රබල ලෙස බලපෑමට ලක්වූ කලාපයක් වන නැගෙනහිර පළාතෙන් වූහ.

- මෙම අට දෙනාගෙන්, සතර දෙනෙක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන්ද, තිදෙනෙක් මඩකළපුව දිස්ත්‍රික්කයෙන්ද, එක්කෙනෙක් අම්පාර දිස්ත්‍රික්කයෙන් ද වූහ.

- පුත්තලමෙන් (වයඹ පළාත) එක් කාන්තාවක්ද, පොළොන්නරුවෙන් (උතුරු මැද පළාත) තවත් කාන්තාවක්ද මෙම අධ්‍යයනයෙහි කොටසක් වූහ.

- මීට අමතරව, වවුනියාව, පුත්තලම, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්කවල මුස්ලිම් ප්‍රජාව සමග වැඩකරන ක්‍රියාකාරිනියන් සමග දිස්ත්‍රික්ක පාදක කරගත් ඉලක්කගත කණ්ඩායම්



සාකච්ඡා පහක් පවත්වන ලදී. නීතිඥයින් සහ මානව හිමිකම් ක්‍රියාකාරිනියන් සමගද තනි පුද්ගල සාකච්ඡා අටක් පවත්වන ලදී.


- ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සහ තනි පුද්ගල සාකච්ඡා අවසන් කළ පසු, දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන පර්යේෂිකාව ලෙස කටයුතු කිරීමට මෙම කණ්ඩායම් එකකින් එක් පුද්ගලයෙකු තෝරා ගන්නා ලදී. ඉන්පසු මෙම පුද්ගලයා පර්යේෂණ සහායිකාවන් ලෙස පත් කළ ප්‍රාදේශීය ක්‍රියාකාරිනියන් තිදෙනෙකු (උපදේශන අත්දැකීම් සහිත) සමග සම්බන්ධ කරන ලදී.

- බලපෑමට ලක්වූ කාන්තාවන් සමග මූලික සාකච්ඡා පැවැත්වීමට සහ මෙම අධ්‍යයනයේ කොටසක් වීමට ඔවුන්ගේ අනුමැතිය ලබාගැනීමට ප්‍රධාන පර්යේෂිකාව පර්යේෂණ සහායිකාවන් පුහුණු කළාය. ඉන්පසු තනි පුද්ගල සාකච්ඡා ආරම්භ කිරීමට පෙර විස්තරාත්මක ප්‍රශ්නාවලියකට පිළිතුරු සපයන ලෙස මෙම කාන්තාවන්ගෙන් ඉල්ලීම් කෙරුණි.

'වසර දෙකක් පමණ ගෙවී ගොස් ඇතත්, මම තවමත් මෙම සිද්ධියෙන් වේදනා විඳිනවා. තවද සම්පූර්ණ කථාන්දරය කිසිවෙකුට පැවසීමට නොහැකි බව හැඟෙනවා. මම ඔබ සමගවත් සියළු විස්තර බෙදාහදා ගන්නේ නැහැ.'

- සම්මුඛ සාකච්ඡා ආරම්භයේදී, ලිංගික අල්ලස් පිළිබඳ සිද්ධීන් ගැන තොරතුරු බෙදා හදා ගැනීමට මෙම කාන්තාවන් පෙළඹවීම අපහසු විය. එබැවින්, ඔවුන්ගේ විශ්වාසය සහ සැකයෙන් තොර බව දිනාගැනීම සඳහා, පර්යේෂිකාවෝ එක් එක් දිස්ත්‍රික්කය තුළ දැනටමත් මෙම කාන්තාවන් සමග සම්බන්ධකමක් පිහිටුවාගෙන ඇති හෝ යම් අයුරකින් මෙම කාන්තාවන්ට සහාය ලබා දී ඇති ප්‍රජා සජීවීකාරකවරියක් හො කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාකාරිනියක් සමග කටයුතු කළහ.

- සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවක් රහස් බෙදාහදා ගැනීමට කැමති වීමට පෙර කිහිප



‘මට ඔහුගේ මුහුණට කෙළ ගසා පහර දෙන්නට තිබුණා. නමුත් ඔහු අපේම ප්‍රජාවේ පොලිස් නිලධාරියෙක්.’

වතාවක් ඔවුන්ව බැහැදැකීමට යාම අවශ්‍ය විය. කාන්තාවන් සිය අත්දැකීම් ගැන කතා කිරීමට ස්වාධීන හැඟීමක් ඇතිකර ගැනීමට පෙර, දැනටමත් ප්‍රලේඛනගත කර ඇති සිද්ධීන් ගැන සහ උතුරෙහි කලින් කළ අධ්‍යයනය පදනම් කොට ගෙන දැනටමත් සිදුකර ඇති උද්දේශන කටයුතු ගැන දීර්ඝ සාකච්ඡා පැවැත්වුණි.

- සමහර අවස්ථාවලදී, මූලික සංවාද කිහිපයක් පැවැත්වූ පසුව වුවද, ලිංගික අල්ලස පිළිබඳ ඔවුන්ගේම අත්දැකීම්වල විස්තර සැපයීමට කාන්තාවෝ මැළි වූහ. මෙම සම්මුඛ සාකච්ඡා අවසාන වාර්තාවෙහි ඇතුළත් කිරීමට නොහැකි විය.
- සම්මුඛ සාකච්ඡා පවුලේ අනෙකුත් සාමාජිකයින් ඉදිරිපිට සිදුවූ අතර, සමීප විස්තර බෙදා හදා ගැනීම සඳහා එය ඉතා හිතකර පරිසරයක් නොවීය.

‘මම වරින්වර ඔහුගේ අවශ්‍යතා ඉටු කරන්නේ නම්, දරුවාගේ සියළු වියහියදම් ගැන ඔහු බලා ගන්නා බවත්, පාසැලේ මගේ තනතුර ස්ථිර කරන බවත් ඔහු මට පැවසුවා.’

- සිය බලතල අනිසි ලෙස භාවිතා කර ලිංගික අල්ලස් සඳහා පෙළඹවීම් කළ රාජ්‍ය නිලධාරීන්ගේ නම් සඳහන් කරන ලෙස කාන්තාවන් දෙදෙනෙකු පර්යේෂිකාවට ඉල්ලීම් කළහ. කෙසේවෙතත්, මෙම පිරිමින් භුක්ති විඳින බලතල සහ වින්දිතයින්ට ඇති ආසන්නබව සැළකිල්ලට ගෙන, ඔවුන්ගේ නම් අත්හැර දැමීමට තීරණය කරන ලදී.

- වින්දිතයාව සෘජුවම චූදිතයාට සම්බන්ධ කරන තොරතුරු, සිද්ධීන් දහයෙන්ම ඉවත් කර ඇත.

- සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවන් සමහරකට පසුව උපදේශන සේවා සපයන ලදී.

# සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන් සන්දර්භගත කිරීම

- සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ කාන්තාවන්ගෙන් බහුතරයක් තනිකඩ වූ අතර ඔවුන් මත යැපෙන කුඩා දරුවෝ හෝ වැඩිහිටි දෙමාපියෝ සිටියහ.

- සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවන් දසදෙනාගෙන් සය දෙනෙක් දික්කසාද වුණු හෝ සැමියා විසින් අත්හැර දමන ලද අය වූහ. එක් කාන්තාවකගේ විවාහය සතියකට වඩා නොපැවතුණි. මුස්ලිම් ප්‍රජාව තුළ පවතින ඉහළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව අනුපාතය, දික්කසාද සහ අත්හැර දැමීම්වලට හේතුව වනුයේ, බහුභාර්යා සම්බන්ධතාවලට පිරිමින්හට ඇති අයිතිය බව කාන්තාවෝ පෙන්වා දුන්හ.

- ඔවුන්ව ඉතා බාල වයසේදී විවාහ කර දීම හෝ ප්‍රධාන ආදායම් උපයන්නාගේ මරණින් පසු බාල වයසේදී වැඩ කිරීම ආරම්භ කිරීමට සිදුවීම නිසා මෙම කාන්තාවන්ගෙන් බහුතරයකට තිබුණේ ඉතාම මූලික මට්ටමක අධ්‍යාපනයක් පමණි.

- එක් තරුණ, අවිවාහක කාන්තාවක් පමණක් රාජ්‍ය නොවන සංවිධානයක ව්‍යාපෘති නිලධාරිනියක් ලෙස කටයුතු කරන අතරතුර අධ්‍යාපනය දිගටම කරගෙන ගිය නමුත්, ඇගේ රැකියා අභිමතාර්ථයන් ඉවත තැමට සිදුවූයේ ඇගෙන් ලිංගික අල්ලසක් ඉල්ලූ විටය.

- මෙම කාන්තාවන් බහුතරයකට කුසලතා නොතිබූ බැවින්, තිරසාර ජීවනෝපායයන් හි යෙදීමට ඔවුන්ට නොහැකි විය. ඔවුන් ජීවිතය ගැට ගසා ගත්තේ, මැසීමෙන්, කෙටි කෑම සහ උදේ ආහාර සෑදීමෙන්, කජු ශුද්ධ කිරීමෙන්, පිරිසිදු කරන්නෙක් ලෙස වැඩ කිරීමෙන් යනාදියෙනි. එක් කාන්තාවකට දුප්පත්කම නිසා ඇගේ එක් දරුවෙකු දරුකමට හදා ගැනීම සඳහා දීමට පවා සිදුවිය.

- කාන්තාවන් දෙදෙනෙකු සමාජ සේවයේ යෙදීමනිසා පොදුවේ ප්‍රජාවේ ගෞරවය ඔවුන්ට ලැබී තිබුණි.

- කාන්තාවන් කිහිපදෙනෙකු ඔවුන්ව සහ ඔවුන්ගේ දරුවන් නඩත්තු කිරීමට නොහැකි වීමෙන් හෝ තනිකඩ කාන්තාවන් ලෙස ඔවුන්ට ඇති අවදානම වැඩි බව දෙමාපියන්ට හැඟීයාමේ හේතුවෙන් කිහිප වරක් විවාහ වී තිබුණි.

- සමහර කාන්තාවෝ අපචාරාත්මක විවාහ සම්බන්ධතාවලින් පීඩා විඳ හෝ අඛණ්ඩව පීඩා විඳිමින් සිටියහ.

- කාන්තාවන් සත්දෙනෙක් ලිංගික අල්ලස් අත්දකින විට අවුරුදු 30 ක් වයසැති හෝ ඊට අඩු වයස්වල සිටියහ.

- කාන්තාවන් පස්දෙනෙක් නිරීක්ෂණය කරන ලද්දේ ඔවුන්ගේ හුදකලා බව පිළිබඳ පරිකල්පනය සහ අවදානම් සහිත බව ලිංගික අල්ලස් ඉල්ලීමට හේතු වූ බව ය.

# සොයාගැනීම් පිළිබඳ විශ්ලේෂණය

- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස පීතෘමූලික සහ කාන්තාවන්ව ප්‍රමාණවත් තරම් අගය නොකරන හෝ ගරු නොකරන ශ්‍රී ලාංකීය සමාජයෙහි පුළුල් සන්දර්භය තුළ වටහා ගත යුතුය. නිදසුනක් ලෙස, එක් කාන්තාවක් විසින් සිය සැමියා ඇයට නිරන්තරයෙන් පහර දෙන බව, සියල්ලන් පිරිමින් වන කාති අධිකරණයට පැමිණිලි කළ විට, ඔවුන්ගේ එකම ප්‍රතිචාරය වූයේ, ඇය එම ජීවිතයට

> ‘එක් අතකින් මම පැමිණිලි කළහොත් ඔහු මාව මරයි කියා බය හිතුණා. අනික් අතට හැමෝටම මා ගැන මොනවා හෝ කථාවක් සැදීමට මෙයින් ඉඩ ලැබේ යැයි සිතුණා. මොකද මේ වනතුරු පිරිමින්ට මගේ වැරදි සොයා ගැනීමට බැරි වුණ නිසා.’

හැඩගැසිය යුතු බවත්, නැතහොත් ඇගේ සැමියා වෙනත් කාන්තාවක් විවාහ කර ගත හැකි බවත්ය

- පිරිමින් විසින් වැන්දඹුවන් සහ තනිකඩ කාන්තාවන් විශේෂයෙන් අවදානම් සහිත බව, හික්මවිය හැකි බව සහ ලිංගික ගොදුරු බවට පත් වීමට විවෘත බවට පරිකල්පනය කිරීම ශ්‍රී ලාංකීය සමාජයේ සියළු තලයන් අතර පවතින පොදු සංසිද්ධියකි. බෙලහීන කාන්තාවන් හෝ තනිකඩ කාන්තාවන් රාජ්‍ය නියෝජිතයින්ගෙන් සහ ආයතනවලින් විවිධ සේවාවන් ඉල්ලීම වැනි බල අසමානාත්මතා සහිත සන්දර්භයන් තුළ මෙය තවදුරටත් උග්‍ර වේ.
- සමහර කාන්තාවන් ලිංගික අල්ලසෙහි බහුවිධ තත්ත්වයන්ට මුහුණ දී ඇති අතර, තවත් අය විවාහ වීමෙන්, නැවත විවාහ වීමෙන් සහ ගෘහ සේවිකාවක් ලෙස සේවය කිරීමට විදේශ ගත



> ‘මම මහ රෑ අවදි වෙන අතර ඔහු මාව දූෂණය කරන නපුරු හීන නිතරම දකිනවා.’

වීමෙන් කරදරයෙහි වැටෙන අවස්ථාවලින් බේරීමට උත්සාහ දරා ඇත. බොහෝ ලිංගික සූරාකෑමේ තත්ත්වයන්හි තර්ජන අවසන් වී හෝ මඟ හරවා ගෙන ඇතත්, වසර ගණනාවක් ගතවී තිබියදීත් හෝ ගොදුරු සොයන්නා ඔවුන්ට ආසන්න වටපිටාවෙහි ජීවත් වේ නම් හෝ සේවය කරයි නම්, සමහරක් මෙම කාන්තාවන්ගේ ජීවිතවලට දිගින් දිගටම විශාල ප්‍රමාණයෙන් බලපායි.

- බොහෝ කාන්තාවන් ඔවුන් මුහුණ දුන් ලිංගික අල්ලස් සිද්ධිය ගැන මිතුරියකට හෝ ඥාතියෙකුට විශ්වාසයෙන් පවසා තිබුණි. කෙසේවෙතත්, බොහෝ කාන්තාවන් පිටස්තරයෙකුට ඒ ගැන කථා කළ ප්‍රථම අවස්ථාව මෙය විය. එවිටද, ඔවුන් මුහුණදුන් ඛේදජනක සහ අපහසුකාරී තත්ත්වයන් පිළිබඳ සියළු විස්තර හෙළිදරව් කිරීමට සමහරෙකුට අපහසුතාවයක් දැනුණි.

- ලිංගික අල්ලස් ඉල්ලූ අය ඔවුන් හඳුනන හෝ ඔවුන්ගේ ප්‍රජාවෙන් වූ විටල එනම්ල මුස්ලිම් පිරිමින් වූ විටල කාන්තාවෝ විශේෂයෙන් කම්පනයට සහ කලබලයට පත්වූහග මම ඇඳගෙන ඉන්න අබායාවටවත් ඔහු ගරු කරයි කියා මම සිතුවා'යැයි එක් කාන්තාවක් පැවසුවායග

- සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූවන් සඳහන් කළ ලිංගික අල්ලස් සිද්ධීන් දහයෙන් පැමිණිලි ඉදිරිපත් කර තිබුණේ කාන්තාවන් තිදෙනෙක් පමණි - එක් කාන්තාවක් ස්ථාන භාර නිලධාරි වෙත සහ පොලිස් ස්ථානයේ කාන්තා කාර්යාංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. තවත් කාන්තාවක් ස්ථාන භාර නිලධාරි, කාන්තා කණ්ඩායමක් සහ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණු අතර, අනෙක් කාන්තාව ඇය සේවය කළ රාජ්‍ය නොවන සංවිධානයෙහි ජාත්‍යන්තර මූල්‍යාධාර සපයන්නා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි.

- මෙම පැමිණිලිවලින් කිසිවක් බරපතල ලෙස නොසැළකීම හෝ අපරාධකරුවන්ට දඬුවම් නොදීම හේතුවෙන් කාන්තාවෝ තවදුරටත් අතරමං වූහ.

- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස් පිළිබඳ සිද්ධීන් කාන්තාවන් බරපතල ලෙස මානසික පීඩනයට පත් කර ඇත. සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් සඳහන් කළේ සිද්ධිය අතරතුර සහ ඉන්පසු ඔවුන් පිළිකුල, ලැජ්ජාව, දුක, ක්‍රෝධය සහ මුළාව වැනි හැඟීම් අත්දුටු බවයි.

- එක් කාන්තාවක් සිද්ධියෙන් පසුව වහාම වමනය කළ අතර, තවත් කාන්තාවකට දුර්වල සහ අප්‍රාණික ගතියක් දැනුණි. තවත් කාන්තාවක් ඇයව ලිංගිකව ගොදුරු කරගත් තැනැත්තා ඇයව දූෂණය කරන බවට නිතරම නපුරු සිහින දුටුවාය. තවත් කාන්තාවක් වසරක් පුරා ඇගේ නිවසින් පිට නොගිය අතර ආහාර ගැනීමේ අපහසුතාවයකින් පෙළුණාය. තවත් කෙනෙක් කිසිදා ආපසු හැරවිය නොහැකි 'පිළිකාවටත් වඩා නරක තුවාලයක්' ඇයට ලබාදුන් ලෙස ඇයගේ අත්දැකීම විස්තර කළාය.

- දෙමාපියන්, මිතුරියන්, සහ සමහර අවස්ථාවල හඳුනන අය වුවද, ලිංගික අල්ලස් ඉල්ලීම්වලට විරුද්ධ වීමට මෙම කාන්තාවන්ට සහාය දැක්වීමේදී තීරණාත්මක භූමිකාවක් රඟපා ඇත. ඔවුන් සානුකම්පිතව සවන් දීම, උපදෙස් සහ දිරිගැන්වීම් ලබාදීම සහ ලිංගික ගොදුරු සොයන්නාගේ බලය මඟ හරවා ගැනීමට උදව් දීම පවා සිදුකර ඇත.

- කෙසේවෙතත්, සිය සැමියා හට විශ්වාසයෙන් ඒ ගැන ප්‍රකාශ කළ කාන්තාවට අවසානයේදී සැමියා පහර දුන්නේය. එයට හේතුව වූයේ, ඇය අපරාධකරුට අනුබල දුන් බව ඔහු උපකල්පනය කළ නිසාය.

- සමහර කාන්තාවෝ ලිංගික ගොදුරු ගැනීමට එරෙහිව සටන් කිරීමට ඔවුන්ගේ ඇතුලාන්ත ශක්තිය සහ අධිෂ්ඨානය මත රැඳුණහ. කාන්තාවන් දෙදෙනෙක් උපදේශනය ලබාගත් අතර, තවත් කෙනෙක් ඇය ජීවිතයේ ඉදිරියට ගිය බව සහ ඇයගේ අපරාධකරුවා හට අල්ලාහ් දඬුවම් ලබාදෙනු ඇති බව සඳහන් කළාය.

'ඔහු මා සමග බොහෝ වේලාවක් කතා කරමින් සිට, මා හුදකලා ජීවිතයක් ගත කරන්නේ මන්දැයි ඇසුවා. මා ඔහු සමග එදා රෑ නිදා ගන්නේදැයි ඔහු විවෘතවම ඇසුවා.'


# අපරාධකරුවෝ/චූදිතයෝ

- ලිංගික ගොදුරු ලබාගත් සියල්ලෝම රාජ්‍ය නියෝජිතයෝ වූහ:
  - පොලිස් නිලධාරීන් (සිද්ධීන් 3 ක්)
  - දිස්ත්‍රික් ලේකම් (එක් සිද්ධියක්)
  - පළාත් සභාවක මන්ත්‍රීවරයෙක් (එක් සිද්ධියක්)
  - පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ ලේකම් (එක් සිද්ධියක්)
  - පරිවාස නිලධාරි (එක් සිද්ධියක්)
  - ග්‍රාම නිලධාරි (එක් සිද්ධියක්)
  - රජයේ පාසැලක පරිපාලක (එක් සිද්ධියක්)
  - නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සේවකයෙක් (එක් සිද්ධියක්)

- සිද්ධි අධ්‍යයන තුළ සඳහන් වූ නිලධාරීන් කිහිප දෙනෙක්ම ලිංගික ගොදුරු ගන්නන් ලෙස ඒ වන විටත් අපකීර්තියට පත්ව සිටි බව සැළකිය යුතු කරුණකි. එකම පොලිස් ස්ථානයට යාමේදී ලිංගික අල්ලස අත්දුටු බවට සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් දෙදෙනක් පැමිණිලි කළහ.

- සමහර රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නිල පැමිණිලි කර තිබුණත්, ලිංගික ගොදුරු ගන්නෙක් ලෙස අන් අය දැනටමත් නම් දරා සිටියත්, එය ඔවුන්ගේ ලිංගික ගොදුරු ගැනීම දිගටම සිදුකිරීමට බාධාවක් නොවීය.

- පොලිස් නිලධාරීන්ට එරෙහිව පැමිණිලි ඉදිරිපත් කළ විට, ඔවුන්ගේ සගයෝ එම චෝදනා බරපතල ලෙස නොසැළකූහ. එක් නිලධාරියෙකු විසින් පැමිණිල්ල සටහන් කර ගැනීම ප්‍රතික්ෂේප කර කාන්තාව ස්ථාන භාර නිලධාරියා හමුවීම වළක්වන ලදී. තවත් සිද්ධියකදී, ස්ථාන භාර නිලධාරියා පැමිණිලිකාරියට බැණ වැදී, ඇය වැනි කෙනෙකු වෙනුවෙන් ඔහුට කාල වේලාව නොමැති බව පැවසීය. කලකිරීමට හේතු වන්නේ, කාන්තා සහ ළමා කාර්යාංශයේ පැමිණිලිකාරියව දන්නා හඳුනන කාන්තා පොලිස් නිලධාරිනියට කළ පැමිණිල්ල ද බරපතල ලෙස නොසැලකීමයි. ඇය 'හුඟක් දබර කරන බවත්, මෙම කථාන්දර සාදා කියන බවත්' කාන්තා පොලිස් නිලධාරිනිය මෙම කාන්තාවට දැන්වූවාය. මානව හිමිකම් කොමිෂන් සභාවට කළ පැමිණිල්ලටද කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.



> 'ඔහු මගේ ප්‍රජාවේ කෙනෙක්. මම ඇඳගෙන ඉන්න අබායාවටවත් ඔහු ගරු කරයි කියාමම සිතුවා.'

## ලිංගික සූරාකෑමට සහ ලිංගික අල්ලසට මග පෑදූ වාතාවරණයන්

ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස පිළිබඳ සිද්ධීන් අවබෝධ කර ගත යුත්තේ මෙම කාන්තාවන් ලිංගික ගොදුරු බවට පත්වීමේ අවදානමට ඔවුන් පත්කරන ඔවුන්ගේ ජීවිතවල පුළුල් සන්දර්භය තුළය.

- ලිංගික අල්ලස් සිද්ධීන් සතරක් සිදුවූයේ මෙම කාන්තාවන් ආර්ථික වශයෙන් තමා විසින්ම නැගී සිටීමට උත්සාහ කළ විටය - විශ්‍රාම වැටුපක් පිරිනමනු ලබන රාජ්‍ය සේවයට ඇතුල් වීමට සෙවූ විට හෝ ගෘහ සේවිකාවක් ලෙස මැද පෙරදිගට යාමට උත්සාහ කළ විට.
- ලිංගික අල්ලස් සිද්ධීන් තුනක් සිදුවූයේ ඉඩම් ආරාවුලක් සම්බන්ධව, දරුවාගේ නඩත්තු මුදල් නොගෙවීම සහ මරණයක් සහතික කර ගැනීම සඳහා කාන්තාවන් නීතියේ සහ සාමයේ ආරක්ෂකයින් සහ යුක්තිය සඳහා ඔවුන්ට ඇති ප්‍රාථමික පිහිට වන පොලීසියේ සේවාවන් ලබාගැනීමට ගිය විටය.
- සිද්ධීන් දෙකක් සිදුවූයේ, කාන්තාවන් සමාජ සේවයේ යෙදී සිටියදීය - එක් කාන්තාවක් අන්ත දුගී කාන්තාවක් සඳහා වැසිකිළියක් ලබාදීමට උත්සාහ කළ අතර එක් කාන්තාවක් ඇගේ ප්‍රාදේශීය පාසැලෙහි ශ්‍රේණිය උසස් කර ගැනීමට උත්සාහ කළාය.
- එක් සිද්ධියක් සිදුවූයේ කාන්තාවක් පිළිකා රෝග යෙන් පෙළුණු තම තරුණ දියණියට වෛද්‍ය සහාය ලබාගැනීමට සෙවීමේදීය.

> 'මා වැනි තරුණ මුස්ලිම් කාන්තාවකට අධිකරණයට යාමට නොහැකියි...'

## ලිංගික සූරාකෑමේ සහ ලිංගික අල්ලසෙහි ස්වභාවයන්

- කාන්තාවගේ නිවසට රාත්‍රී කාලයේ ගොස් ලිංගික වාසි ඉල්ලා බල කිරීම.
- විවිධ ව්‍යාජ හේතු දක්වමින් කාන්තාවගේ නිවසට දිවා කාලයේ ගොස් ඇයව ස්පර්ශ කිරීමට සහ තමා වෙතට ඇද ගැනීමට උත්සාහ දැරීම.
- ලිංගික හිංසනය සහ නුසුදුසු කායික හැසිරීමග
- ලිංගික සම්බන්ධකම් පැවැත්වීමට ඉල්ලීම.
- ගොදුරු සොයන්නා සමග ජීවත්වීමට කාන්තාවගෙන් ඉල්ලීම.
- බොහෝ සවස් වනතුරු කාන්තාවට කාර්යාලයේ රැඳී සිටීමට සැළැස්වීම හෝ කාර්යාලීය වේලාවෙන් පසු කාර්යාලය තුළ ඔහුව බැහැදකින ලෙස ඇගෙන් ඉල්ලීම.
- කාමුක අදහස්, ලිංගික ඇනුම්පද සහ අපවාදාත්මක සහ නින්දා සහගත වචනවලට යටත් වීමට සිදුවීම, උපහාසාත්මක විහිළුවල ඉලක්කය වීම.
- ඇය කිසිවෙකුහට පැමිණිලි කළහොත් හෝ දැනුම් දුනහොත් ඇයට හානි කරන බවට වන වාචික තර්ජනවලට මුහුණ දීම.
- ඔහුගේ ඉල්ලීම්වලට එකඟ නොවීමේ හේතුවෙන් ඇගේ දරුවා රැගෙන යාමෙන් ඇයට දඬුවම් කිරීම.

> 'මම ඉස්ලාම් ආගම වැළඳගත් කෙනෙක් නිසා මුස්ලිම් ප්‍රජාවේ කිසිවෙකුගෙන් මට සහායක් නොලැබෙන බවත්, ඔහු සමග ජීවත්වීම ගැන සළකා බලන ලෙසත් ඔහු කීවා.'

කාන්තාවන්ගෙන් කිසිවෙක් ලිංගික අල්ලස් ඉල්ලීම් කිසිවකට සත්‍ය වශයෙන් එකඟ වූ බව පිළිනොගැනීම සැළකිල්ලට ගත යුතු කරුණකි. එසේ වූයේ, ඔවුන් හට සෑම විටකම එම ස්ථානයෙන් පලා යාමට හැකිවූ නිසාය. කෙසේවෙතත්, 'ඔවුන්ගේ පෞද්ගලික පෙදෙස්' අතගෑමට ලක්වූ බව සමහර කාන්තාවන් සඳහන් කළ අතර, එම ලිංගික අඩන්තේට්ටම් ගැන වැඩිදුර විස්තර ලබාදීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ.

සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන් අතර ලිංගික ගොදුරු බවට පත්වීමට විරෝධය පෑ අයගෙන් බහුතරයක් අවදානම් තත්ත්වයක් නවත්වා ගැනීමට හෝ මඟහරවා ගැනීමට ඔවුන් භාවිතා කළ විවිධ ප්‍රයෝජනවත් උපක්‍රම කිහිපයක් බෙදාහදා ගත්හ. මෙවැනි උපක්‍රම පුළුල් පරාසයක විහිදුනු අතර සමහර ඒවා අන් ඒවාට වඩා සාර්ථක වී ඇත:

- ඔවුන් සෙවූ සේවාව හෝ ලියකියවිලි අතහැර දැමීම.
- පැමිණීමේ ලේඛනයෙන් ගොදුරු සොයන්නාට පහරදීම.
- ගොදුරු ගන්නා ඉවතට තල්ලු කර දිව යාම.
- ගොදුරු ගන්නාට බැණ වැදීම, කෑගැසීම සහ යම් දේවල් ඔහු වෙත වීසි කිරීම.
- ඉක්මණින් පිටවීම සඳහා ත්‍රීරෝද රථයක් සූදානමින් තැබීම.
- අසල්වැසියෙකුගේ නිවසට පලා යාම.
- ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වෙත මෙන්ම කාන්තා කාර්යාංශය වෙත, කාන්තා කණ්ඩායම් සහ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
- මඟහැරීම.
- මිතුරියකගේ උදව් ඉල්ලීම.
- මිතුරියකගේ මවගෙන් උදව් ඉල්ලීම.
- අනෙක් රාජ්‍ය නිලධාරීන්ගේ උදව් ලබාගැනීම.
- කාන්තා පොලිස් නිලධාරිනියකගෙන් උදව් ඉල්ලීම.


සහන හෝ වන්දි ලබා ගැනීමට කාන්තාවන් අසමත් වූයේ මන්ද?

- ■ කාන්තාවන් පැමිණිලි ඉදිරිපත් නොකිරීමට ප්‍රධාන හේතු දෙක වූයේ:
  - සමාජ අපවාදය සහ මුස්ලිම් ප්‍රජාව තුළ අභිමානය සහ ගෞරවය අහිමිවීමේ බිය. සියළුම කාන්තාවන් පැවසුවේ තමාව වැරදිකරු ලෙස පරිකල්පනය කරන බවයි.
  - තමාගේ පවුලේ සමීප සාමාජිකයෙකු නොවන පිරිමියෙක් සමග ඔවුන් තනිවම සිටි බව දැනගතහොත් මුස්ලිම් දේවස්ථානයෙහි දෝෂාරෝපණයට ලක්වේයැයි කාන්තාවෝ බිය වූහ: 'අපේ ආගමට අනුව එයම පමණක් වුවත් මට එරෙහිව යාමට ප්‍රමාණවත් විය හැකියි.'
  - ඇයට සිදුවූ දේ ඇගේ සහෝදර සහෝදරියන්ට ආරංචි වුවහොත්, ඔවුන් ඇයට තනිව ගමන් යාම තහනම් කරනු ඇතැයිද, එවිට ඇගේ සමාජ සේවය දිගටම කරගෙන යාමට නොහැකි වනු ඇතැයි සිතා එක් කාන්තාවක් බිය වූවාය.
  - අපරාධකරු විශේෂයෙන් කාන්තාවට වඩා ආර්ථිකව සහ සමාජයීයව බලගතු බැවින් ඔහු වෙතින් පලිගැනීමට ලක්වේයැයි බිය. බොහෝ කාන්තාවෝ අපරාධකරු සේවය කළ ආයතනය නම් කිරීමට පවා බිය වූහ. කෙසේවෙතත්, අපරාධකරුට දඬුවම් නොලැබුණහොත්, අනෙකුත් කාන්තාවන්ගෙන් ලිංගික අල්ලස් ඉල්ලීම දිගටම කරගෙන යනු ඇතැයි ඔවුහු සැළකිලිමත් වූහ.

- ■ ඔවුන්ව විශ්වාස නොකරනු ඇතැයි කාන්තාවන්ට හැඟුණි. මන්දයත්:
  - ඇය දුප්පත් සහ බෙලහීන වූවාය.
  - ඇය ලිංගිකව දුරාචාර බවට සහ අසභ්‍ය බවට පරිකල්පනය කර තිබුණි.
  - ඇයට යෝජනා ගෙනෙනු ලැබුවේ බොහෝ ප්‍රබල දේශපාලන චරිතයක් විසිනි.
  - ඇයට යෝජනා ගෙනෙනු ලැබුවේ ඔහුගේ පුණ්‍ය කටයුතු සඳහා හොඳින් ගෞරවය සහ කීර්තිය ලැබුණු කෙනෙක් විසිනි.
  - සාක්ෂිකරුවෝ නොසිටියහ.
  - පැමිණිලි ගැන උනන්දුවක් නොදැක්වීම හෝ සමච්චලයට ලක් කිරීම සිදු විය.

- ■ බොහෝ කාන්තාවෝ ඇයගේ පැමිණිල්ල සටහන් කර ගන්නා පුද්ගලයා ද ඇයට ලිංගිකව හිංසා කරනු ඇතැයි බිය වූහ.

- ■ බොහෝවිට ඉතාමත් නරක ලිංගික ගොදුරු ගන්නන් වූයේ නීතිය බලාත්මක කරන නිලධාරීන් බවට කාන්තාවන් අතර පොදු එකඟත්වයක් තිබුණි. (තවද අනෙකුත් නිලධාරීන්, ස්ථාන භාර නිලධාරීන් සහ කාන්තා පොලිස් නිලධාරීන් වුවද කාන්තාවන්ට සළකන ලද්දේ කෙසේදැයි යන්න ගැන සඳහන් කිරීම් සඳහා ඉහත බලන්න).



'තමාගේ පවුලේ සමීප සාමාජිකයෙකු නොවන පිරිමියෙක් සමග ඔවුන් තනිවම සිටි බව දැනගතහොත් මුස්ලිම් දේවස්ථානයෙහි දෝෂාරෝපණයට ලක්වේ යැයි කාන්තාවෝ බිය වූහ: අපේ ආගමට අනුව එයම පමණක් වුවත් මට එරෙහිව යාමට ප්‍රමාණවත් විය හැකියි.'

- කාන්තාවෝ බොහෝ දෙනෙක් රාජ්‍ය නොවන සංවිධානවලට සහ අයිතීන් පාදක කරගත් ක්‍රියාකාරීත්වයන්ට නිරාවරණය වී තිබුණේ කලාතුරකිනි. තවද ඔවුන්ට සහාය සහ වන්දි ලබාගැනීම සඳහා ආයාචනා කළ හැකි නෛතික ආයතන හෝ ස්වාධීන, රාජ්‍ය නොවන බලධාරීන් වෙත වුවද ප්‍රවිෂ්ඨ විය හැකි අන්දම පිළිබඳව තිබුණේ සීමාකාරී දැනුමකි.
- පොලිස් නිලධාරීන් වෙතින් ලිංගික සූරාකෑමට ලක්වූ කාන්තාවන් දෙදෙනෙක්ම, මානව හිමිකම් කොමිෂන් සභාව ගැන දැන සිටි අතර, එක් කාන්තාවක් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් පවා ඉදිරිපත් කර තිබූ නමුත් පලක් නොවීය. තවත් කාන්තාවක් සඳහන් කළේ, ඇය මානව හිමිකම් කොමිෂන් සභාවට ගියහොත්, එම දාමරික කම සිදු කළ පොලිස් නිලධාරීන්ගේම උදව් ඇතිව මානව හිමිකම් කොමිෂන් සභාව ගැටළුව විමර්ශනය කරනු ඇති බැවින් ඇයට එම ක්‍රියාවලිය ගැන විශ්වාසයක් නොමැති බවයි.
- අපරාධකරුවන්ට දඬුවම් දියයුතු බව කාන්තාවන්ගෙන් බහුතරයකට පැහැදිලි වූ නමුත් ලිංගික අල්ලස හඳුනාගන්නේවත් නැති පවතින නෛතික පද්ධතිය හරහා මෙය සිදු වනු ඔවුන් දුටුවේ නැත. එබැවින් ඔවුන් වඩාත් කැමති වූයේ අල්ලාහ් හට අඬ ගැසීමෙන් දිව්‍යමය යුක්තිය ඉල්ලා සිටීමට හෝ සවුදි අරාබිය තුළ කරන අන්දමට අපරාධකරුවාට ගල් ගසා මරාදැමීම වැනි ප්‍රසිද්ධ දඬුවම් ලබාදීමේ හැකියාව ගැන සළකා බැලීමටය.

'මගේ සහෝදර සහෝදරියන් තනිවම කොහේවත් නොයන ලෙස මට අනතුරු අඟවා තිබුණා ඔවුන් මෙය දැනගත්තා නම්, එය මගේ සමාජ කටයුතුවල අවසානය වේවි.'

# නිර්දේශ

- රාජ්‍ය නිලධාරීන්ගේ උසස්වීම් සඳහා සුදුස්සන් තෝරාගැනීමේ පද්ධතියක් තිබිය යුතුය. එවැනි නිලධාරීන්ට එරෙහිව ලිංගික අල්ලස් හා ලිංගික සූරාකෑම්වල පැමිණිලි පිළිබඳ සමාලෝචනයක් එම පද්ධතියට ඇතුළත් විය යුතුය. චරිතය සහ සේවාව පිළිබඳ පළුදු නොවූ වාර්තා සහිත නිලධාරීන්ට උසස්වීම් ලබාදිය යුතු අතර, ලිංගික අල්ලස් ඉල්ලා ඇති අය වහාම සේවයෙන් පහ කළ යුතුය.
- ලිංගික අල්ලස් පැමිණිලි විමර්ශනය කිරීමට අපක්ෂපාතීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදීතාවය පිළිබඳ ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත විශ්වාසනීයත්වයෙන් යුතු නිලධාරීන් අල්ලස් කොමිෂන් සභාව තුළ හෝ මානව හිමිකම් කොමිෂන් සභාව තුළ පත් කළ යුතුය. එම ව්‍යුහය පහසුවෙන් ප්‍රවේශ විය හැකි, ප්‍රතිචාර දක්වන, සහ වඩාත්ම වැදගත්ව, බලපෑමට ලක්වූ කාන්තාවන්ට අභිමානයෙන් යුතුව සහ සදාචාරය පිළිබඳ විනිශ්චයෙන් තොරව සළකන ස්ථානයක් විය යුතුය. වින්දිතයින්ගේ අනන්‍යතාවය සුරැකීමට යාන්ත්‍රණ ස්ථාන ගත කර තිබිය යුතුය.
- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස පිළිබඳ ගැටළුව වටා ඇති අගතීන් පාලනය කිරීමට නිර්මාණය කෙරෙන අධ්‍යාපනය සහ බහුජන දැනුවත් කිරීමේ ව්‍යාපාර හරහා රජය විසින් සමාජමය ආකල්පවල වෙනසක් ප්‍රවර්ධනය කළ යුතුය.
- ලිංගික අල්ලස් පිළිබඳ වින්දිතයින්හට ප්‍රවේශ විය හැකි හෝ ඔවුන්ව යොමු කළ හැකි කාර්යක්ෂම වන්දි ලබාදීමේ ව්‍යුහයක් රජය විසින් පිහිටුවිය යුතුය.
- ලිංගික අල්ලසට සම්බන්ධ නීති සහ වන්දි ගෙවීමේ ව්‍යුහයන් ගැන රාජ්‍ය නිලධාරීන්ට අධ්‍යාපනය ලබා දිය යුතුය.
- කාන්තාවන්ට සමව සැළකීමට පොලිස් නිලධාරීන් පුහුණු කළ යුතුය.
- ලිංගික අල්ලස සඳහා වඩා දැඩි දඬුවම් ඇතුළත් කිරීමට දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කළ යුතුය. තවද, ලිංගික අල්ලසට එරෙහිව වඩාත් ප්‍රබල නීති (නිදසුන් ලෙස, දූෂණය හෝ දූෂණයට උත්සාහ කිරීමට සම්බන්ධ ඒවාට සමාන වඩාත් තදබල දඬුවම්) තිබිය යුතුය.
- අපරාධකරුවන්ට එරෙහිව දැඩි පියවර ගත යුතු අතර, එම යාන්ත්‍රණයන් අන් අපරාධකරුවන් පසුබට කිරීමක් ලෙස ක්‍රියා කිරීම සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතුය.
- ලිංගික අල්ලස් පිළිබඳ වින්දිතයින්ට පැමිණිලි කිරීම හෝ නඩු පැවරීම අනුගමනය කිරීමට රජය විසින් ඔවුන්ට නෛතික සහාය සැපයිය යුතුය.
- වින්දිතයින් ඔවුන්ගේ අත්දැකීම් විවෘතව බෙදා හදා ගැනීමට තීරණය කරන අවස්ථාවලදී, ඔවුන්ට සමාජ අපවාදය දරා ගැනීමට හැකිවීමට, රජය විසින් උපදේශනය සැපයිය යුතුය.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව එහි විධිනියෝග තුළ ලිංගික අල්ලස ඇතුළත් කළ යුතුය.
- කාන්තාවන්ගෙන් ලැබෙන ලිංගික අල්ලස් පැමිණිලි ගැන කටයුතු කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු අතර, පූර්ණ රහස්‍ය භාවය සහතික කළ යුතුය.
- ලිංගික අල්ලස් පිළිබඳ සිද්ධීන් වාර්තා කිරීමට පරිඝණක ආශ්‍රිත අන්තර්ජාල වේදිකාවක් (online platform) නිර්මාණය කළ යුතුය.
- ලිංගික අල්ලස් ගැන කටයුතු කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා විසින් නායකත්වය ගෙන, සිද්ධීන් වාර්තා කරන විට අදාළ රාජ්‍ය ආයතනවලට යොමු කිරීම් කළ යුතුය.
- රාජ්‍ය අංශයේ ලිංගික හිංසනය ආමන්ත්‍රණය කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කර ඇති මාර්ගෝපදේශ, ලිංගික අල්ලස් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කළ හැකි වන පරිදි සංශෝධනය කළ යුතුය. එමෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාව ඒ හා සමග කටයුතු කිරීමට විශේෂ පැමිණිලි ක්‍රියාපටිපාටියක් නිර්මාණය කළ යුතුය.
- සියළුම පශ්චාත්-යුද සේවා සැපයුම් ව්‍යුහයන් සහ යෝජිත සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් තුළ සියයට පනහක් හෝ ඊට වැඩි කාන්තා නියෝජනයක් (සියළුම මට්ටම්වල; ඉහළ සිට පහළට) සහතික කළ යුතුය.
- පොලිස් කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, අල්ලස් කොමිෂන් සභාව, සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වැනි පවතින ස්වාධීන කොමිෂන් සභාවලට ලිංගික අල්ලස් විමර්ශන බලතල එකතු

කළ යුතුය. මෙම සෑම කොමිෂන් සභාවකටම ලිංගික අල්ලස් සිද්ධීන් විමර්ශනය කිරීමට සහ කටයුතු කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සහ විශ්වාසනීය ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව තුළ ඇති යාන්ත්‍රණයන් සහ ඒවාට සම්බන්ධ ක්‍රියාපටිපාටි ගැන කාන්තාවන් දැනුවත්වීම සඳහා ඒවායේ පවතින වන්දි ලබාගත හැකි යාන්ත්‍රණයන් ගැන පුළුල් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කළ යුතුය.
- ලිංගික අල්ලස සහ ලිංගික හිංසනයට අදාලව ශූන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස රජය විසින් රාජ්‍ය පරිපාලන/සේවා දෙපාර්තමේන්තුවල සියළු ප්‍රධානීන් වෙත චක්‍ර ලේඛයක් නිකුත් කළ යුතුය. එවැනි උල්ලංඝණ, එවැනි සිද්ධීන් ගැන කටයුතු කිරීමට පිහිටුවා ඇති නිසි දක්ෂතා සහිත කමිටුවක් මගින් පූර්ණ විමර්ශනයකට භාජනය කළ යුතුයි.
- රාජ්‍ය සේවාවන් සහ අධ්‍යාපනික ආයතන එවැනි පැමිණිලි ගැන කටයුතු කිරීමට සහ ලිංගික අල්ලස වැළැක්වීමට අභ්‍යන්තර යාන්ත්‍රණ සහ මාර්ගෝපදේශ ස්ථාන ගත කළ යුතුයි. එවැනි ප්‍රයත්නයන්, කාන්තාවන්ට පැමිණිලි ගොනු කිරීමට සහ වන්දි ලබාගැනීමට අනුබල දීම සඳහා ප්‍රමාණවත් දැනුවත් කිරීම් සහ හිතකර පරිසරයක් සමග සම්බන්ධ කර තිබිය යුතුය.
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍ර ලේඛ අංක 919 නවක වදය පමණක් නොව ලිංගික අල්ලස හා ලිංගික සූරාකෑමද මැඩලීමට මාර්ගෝපදේශ ඇතුළත් කිරීම පිණිස සංශෝධනය කළ යුතුය.
- කාන්තාවන් සමග සෘජුවම කටයුතු කරන ග්‍රාම නිලධාරීන්, පරිවාස නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, මහජන සෞඛ්‍ය නිලධාරීන් වැනි රාජ්‍ය නිලධාරීන් සඳහා ලිංගික අල්ලසට අදාළව ආචාර ධර්ම සංග්‍රහයක් ස්ථාන ගත කළ යුතුය.
- ලිංගික අල්ලස්, සූරාකෑම, සහ හිංසනය පිළිබඳ සිද්ධීන් ගැන වාර්තා සහ දත්ත ගබඩා පවත්වා ගෙන යාම සියළුම රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනවලට අනිවාර්ය කළ යුතුය.
- නීති සහ ලිංගික අල්ලසට එරෙහිව යෙදෙන දඬුවම්, පොලිස් ස්ථාන, විශ්ව විද්‍යාල, ප්‍රසිද්ධ ස්ථාන, පොදු අවකාශ, මහජන ප්‍රවාහන සහ සියළුම රාජ්‍ය ආයතන තුළ, ඉංග්‍රීසි, සිංහල සහ ද්‍රවිඩ භාෂාවලින් විදහා දැක්විය යුතුය.
- ලිංගික අල්ලස් සිද්ධීන් වාර්තා කිරීමට පවතින පැමිණිලි යාන්ත්‍රණයන් පිළිබඳව බිම් මට්ටමේ ජනතාවට දැනුම් දීමට රජය විසින් මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාරයකට මුලපිරිය යුතු අතර, ඉන් පසුව, මේ සම්බන්ධව යම් නව නීති සම්පාදන/පරිපාලන චක්‍රලේඛ හෝ යාන්ත්‍රණ හඳුන්වා දෙන විට ජනතාව සෝදිසියෙන් තැබිය යුතුය.
- සියළු චක්‍ර ලේඛ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් භාෂා තුනෙන්ම තිබිය යුතු නමුත්, වඩාත්ම වැදගත්ව, සිංහල සහ ද්‍රවිඩ භාෂාවලින් තිබිය යුතුය. ලිංගික අල්ලස් ගැන කටයුතු කිරීමට ස්ථාන ගත කර ඇති විමර්ශන සහ පැමිණිලි යාන්ත්‍රණ සිංහල සහ ද්‍රවිඩ භාෂා දෙකින්ම දක්ෂතා ඇති කාර්ය මණ්ඩලවලින් සමන්විත යුතුය. මානව හිමිකම් කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වැනි ආයතන සිංහල සහ ද්‍රවිඩ භාෂා දෙකෙන්ම ප්‍රවීණතා ඇති කාර්ය මණ්ඩලවලින් සමන්විත විය යුතුය.
- කාන්තා සංවර්ධන නිලධාරීන් ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස් ගැන කටයුතු කරන කේන්ද්‍රීය ලක්ෂ්‍යයන් බවට පත් කළ යුතුය. ඔවුන් මනෝසමාජයීය සහාය සඳහා යොමු කිරීම් ලබාදීමට දැනුම සහ පහසුකම් සහිත විය යුතුය. තවද, අපයෝජනයේ ස්වභාවය ඉහළ මට්ටමේ පැමිණිලි මෙහෙයවීමේ යාන්ත්‍රණවලට සෘජුවම දැනුම් දීමට ඔවුන්ට අධිකාරිය තිබිය යුතුය.
- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලසට සම්බන්ධ ගැටළුවලට මුහුණදෙන කාන්තාවන් ප්‍රවිෂ්ට විය යුතු සේවාවන් ගැන ආගමික නායකයින් දැනුවත් කළ යුතුය - එමෙන්ම, මෙම තොරතුරු පුළුල් ප්‍රජාව සමග බෙදාහදා ගැනීමට ඔවුන්ට අනුබල දිය යුතුය.
- ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස අත්දැක ඇති අයට මනෝසමාජයීය සහාය, එවැනි සේවාවන් ලබාගත හැකි කෙසේද යන්න ගැන දැනුවත් කිරීමත් සමග, පුළුල්ව ලබා ගත හැකිවීම අවශ්‍ය වේ.

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය **(Centre for Equality and Justice)**
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05.
දුරකථන/ෆැක්ස්: +94 11 2055404